සිසිර දිසානායක

හිත නිව්ලා

පන්හිඳට පුංචි පහේ ආරාධනාවක් ලැබුණා මිහිඳු ළමා සමාජයේ විනීතා විජේරත්න නෝනා මහත්තයාගෙන්.

"පුංචි පහේ ආරාධනාවක්" කියලා කිව්වේ ළමා සමාජයක වැඩක් හින්ද ද ?" පින්සල ඇහුවා.

"ඒත් ආරාධනාව වැඩිහිටියන්ගෙන් නේ" පැන්සලත් එකතු වුණා.

"කවුරු කළත් කවුරු ආරාධනා කළත් මේ වැඩේ නම් පුංචි වෙන්නෙ නෑ. අන්තිමට බලාගෙන යනකොට අපේ විජිත ස්වාමීන් වහන්සේගේ වැඩක්...." පන් පන්හිඳ අතික් දෙන්නට කඩිත් දත කට මැදගෙන ලියන මේසට පැන ගත්තා. පන්ට ආරාධනාව ලැබුණේ ඕස්ට්‍රේලියාවේ සංඝනායක කිස්බරෝ ධම්ම සරණ විහාරස්ථානාධිපති පූජ්‍ය පාද නාමවුන්ගේනේ විජිත ස්වාමීන් වහන්සේ ලියපු "හිත නිව්ලා" ගීත එකතුව ගැන යමක් කෙටියෙන් කතා කරන්න.

"මතක ද සන්නස මුල්ම පත්තරයට උන් වහන්සේ ආශිර්වාද කරලා ලිපියක් ලියලා එව්වා. ? පින් අතීතය මතක් කළා."

"ඒක තමයි මාත් හිතුවෙ. යමක් ලිව්වොත් හොඳ. අසෝක සුබසිංහ මහත්තයත් ඔය ගැන මතක් කළා...." පන් ලියන්න පටන් ගත්තා.

සන්නස පසුගිය මාසිකයේ "ගී සඳළුව" ලිපිය තුළින් අප කතා කළේ මෙල්බන් නුවරම නිර්මාණය වුණ තක්ති ගීත තුනක් පිළිබඳව. ඒ අතරින් "මේ උතුම් පෝය දා" ගීතය රචනා කළේ පූජ්‍ය නාමවුන්ගේනේ විජිත ස්වාමීන් වහන්සේයි. උන්වහන්සේ අතින් ලියැවුණ බොහු ගී කීපයකුත්, ළමා ගී කීපයකුත් "හිත නිව්ලා" ගීත එකතුවට ඇතුලත් වෙයි. සියළු ගීත සඳහා තනු සහ සංගීත රටා නිර්මාණය කරන ලද්දේ මව්බිමේ වෙසෙන ඉන්ද්‍රාණි විජයලතා මහත්මියයි. සියළුම ගී ගායනාවන් ගයනි තාක්ෂණ වනිගනායක දියණියගේයි.

ගීය පිළිබඳව සාකච්ඡා කිරීමේදී එහි ප්‍රධාන මූලිකාංග තුන වන පද රචනය, තනුව හා සංගීතය සහ ගායනය පිළිබඳව සැළකිය යුතු වෙයි. මේ වන විට දර්ශන නිර්මාණය කිරීම ද සිව්වන අංගය ලෙසින් ඉහත අංගනයන්ට එක් වී අත්තේය.
මෙම ගීත එකතුවේ අපගේ වැඩි අවධානය පද රචනය වෙත යොමුවෙන්නේ පද නිබන්ධකයාණන් අප අතර වඩ වසන ස්වාමීන් වහන්සේ නමක වන නිසයි.

ඕනෑම කලා නිර්මාණකරුවෙකුට වැදගත් වන මූලික ගුණාංග තුනක් වෙයි. නිසග කුසලතාව, ව්‍යුත්පත්තිය හා සතත අභ්‍යාසය යන අවශ්‍යතා තුනයි ඒ.

නිර්මාණකරණයේදී උපතින් ලබන හැකියාව වැදගත් වෙයි. යම් නිර්මාණයක් කිරීම සඳහා හේතු පාදක වෙන නිමිත්ත හඳුනා ගැනීම හා ඒ සඳහා සංවේදී වීම උපතින්ම ලැබෙන ගුණාංග වෙයි.

පන්සලේදී කුඩා දරුවකු ගැයූ ;

"මේ ළමයා කොහෙන්දෝ ?
රෝස කැලෙන ඇඟින්දෝ....."

කවිය ඇසූ විජිත ගිමියෝ ඊට සංවේදීව එය නිමිති කොට පද පබැඳූ සේක, මෙලෙසින් ;

"අම්මා දවසක් දා
මට තනියට කියලා
රෝස කැලේ ඉඳලා
නංගී ගෙන ආවා"

නිසග කුසලතාවයට එක්වන තවත් අංගයකි පරිකල්පන ශක්තිය.

"මුගි සිරි පා වැදලා
අනන්තයට යනවා
බුදු හාමුදුරුවෝ තිවන් ගියා සේ
ආපසු නෑ එන්නේ.....

දරුවකු හා වළාකුලක් අතර ඇතිවන සංවාදයක කෙළවරයි ඒ. නිවන් යාම පිළිබඳව දරුවකුගේ මනසේ යම් අදහසක් ඇති කිරීමට මවා පාන චිත්ත රූපය අපූරුයි.

නිර්ව්‍යාජ බව හා සරළ බව කලාකරුවකු තුළ තිබිය යුතු යැයි සිතෙයි. කලාකරුවෙකු වීමට නම් යමෙකු පළමුව සැබෑ මිනිසකු විය යුතුයි. යථාර්ථයේ දෙපය ගසාගෙන සිටින තියම මිනිසෙකු තුළ එකී ගුණාංග අභ්‍යන්තරයෙන් ම තිබිය යුතුවෙයි. තමන් වහන්සේගේ නිර්ව්‍යාජ බව පෙන්වන සරළ පද පෙළකි මේ ;

"කිරි දරුවොත් කිරි සීනෙන්
බුදුන් දකිත්වා !
යාළුවෝ සේරමත්
මගේ අම්මා - තාත්තා
හිත නිව්ලා හැම රෑකම
බුදුන් දකිත්වා !

මූලික අවශ්‍යතා තුනෙන් දෙවැන්න වන්නේ ව්‍යුත්පත්තියයි. විෂය හදාරා තිබීම, අත්දැකීමෙන් උගැන්ම යනාදිය ඊට ඇතුලත් වෙයි. යමෙකුගේ ඇසූ පිරූ තැන් අති බව, පොත පත පරිශීලනය, සමාජ හා ජීවන අත්දැකීම් ප්‍රයෝජනයත් නොවන්නේ කා හට ද ?

ආචාර්ය ශාන්තිදේව පාදයන්ගේ බෝධිචර්යාවතාරය කියවා ඇති විජිත ස්වාමීන් වහන්සේ තමන්වහන්සේ වැඩ වසන කුටියේ කවුළුව තුළින් දුටු දසුනක් නිමිත්ත කොට ගෙන ලියූවකි "මේ උතුම් පෝය දා" ගීය. විහාරස්ථානයේ බෝධීන් වහන්සේට ඉහළින් සඳ පායනු කවුළුව තුළින් දකිනා උන් වහන්සේ හට එය නිර්මාණයක් සඳහා නිමිත්ත වෙයි. ඊට සංවේදී වන උන්වහන්සේගේ සිහියට එන්නේ බෝධිචර්යාවතාරයයි. එහිදී නොයෙක් වස්තූන්ගෙන් පුදා කතුවරයා බුදුන් නමදී. මෙහිදී විජිත ස්වාමීන්වහන්සේ බුදුන් නමදින්නේ චන්දු මණ්ඩලය, සූර්ය මණ්ඩලය සහ මිහිකත පිදීමෙනි. ව්‍යුත්පත්තිය නැවුම් අදහස් ගලා ඒමට මහත් සේ උපකාර වෙයි. මේ තවත් එවන් අත්දැකීම් ඇසුරින් ලියැවුන පදපෙළක පදයකි ;

"හිත වැටී තියෙන වේලේ
ශ්‍රද්ධාවද හැකිලේ....."

කලින් දැක, අසා ඇති දේ ද නිර්මාණවලට නිරායාසයෙන් එක්වෙයි.

"ඔබ වහන්සේ ඉවසති
මහා කරුණාවෙන්...."

ඉහත පදයේ "මහා කරුණාවෙන් " කොටස වෙනත් ප්‍රකට ගීයක ද එළෙස්තම ලියවී ඇති නමුදු මළු පදයම ගත් කල එය මෙතෙක් නො ඇසූ යෙදුමක් බවට පත් වෙයි.

මූලිකාංග තුනේ අවසන් අංගය වන්නේ "සතක අභ්‍යාසයයි". කලකට පෙර මව් බිමේදී අප අතර එවකට සිටි ජෝෂ්ඨතම ගී පද නිබන්ධකයෙකු වූ අරිසෙන් අහුබුදුවන් මුණ ගැසීමට වාසනාව ලදිමි. එතුමන්ගේ අවවාදය වූයේ ;

"තමුන්නැහේ ගීත නිබන්ධකයෙකු වන්නට සිතන්නේ

නම් දවසකට එක් ගීතයක්වත් ලිවිය යුතු වන්නේ යැ'යි.

නිරතුරු අභ්‍යාසයෙන් ඕනෑම කාර්යයක් වඩාත් දියුණු කර ගත හැකි නොවේ ද ? මෙය කලාවට පමණක් සීමා නොවේ. කියවීම, ලිවීම නිරතුරුව කිරීමෙන් බස පිළිබඳව අවබෝධය, බස හැසිරවීම පිළිබඳ අවබෝධය මෙන්ම පද රචනයේදී යෙදෙන ආකෘති, වචන, යෙදුම් යනාදියට පවා මනා පුහුණුවක් ලැබෙයි. මේ අතින් ගත් කල පැවිදි හිමි නමකගේ දැහමි හා සාහිත්‍ය පොත පත පරිශීලනය ගිහි පක්ෂයට වඩා බෙහෙවින් වැඩි යැයි සිතේ.

ගරු විජිත ස්වාමීන් වහන්සේ තමන් වහන්සේගේ ගීත රචනා කොට ඇත්තේ සරළ සිංහල බසිනි. ඒ දරුවන්ට පවා කියවිය හැකි, ගැයිය හැකි සහ තේරුම් ගත හැකි වන ලෙසයි. වචන වල ඇති සරළ සුගම බව පසක් කරවන ගීත කීපයකි, "අම්මා දවසක් දා", "ඊයේ රෑ බුදු සමිඳුන්", "බුදුන් උපන් දින" යන ගීත. ගීතවල ගායනීය බවට නිදසුන් කිහිපයකි මේ.

"එළිවෙන තුරු සුව හින්දයි
බුදු කරුණාවෙන්....."

"මහ වෙහෙර පන්සල තියා
ගසක් යට පිරිනිවිතියා"

"සූර්ය මණ්ඩලෙන් පුදා
මේ උතුම් පෝය දා"

අපට නිතර අසන්නට නොලැබෙන වචන ද මෙම පද පෙළ අතර දක්නට ලැබෙයි. "විහග ගීතෙන් ", "පිරිනිවිනායා" ඉන් කීපයකි. නොතුරු යෙදුම් අතරට වෙසක් කුඩුවේ රැළි පිළිබඳව ලියනයවිට "පාට වරල් " යොදා ගැනීමෙන් කළු පසෙකි පාතුය පිළිබඳව ලියනවිට "බඹර වන් පය" යොදා ගැනීමත් එක්වෙයි. කළු පැහැය බඹරුන්ගේ පැහැයයි. පාතුය "පය" නමින් ද හැඳින්වෙයි. සරළ සිංහලයෙන් මිදී නොදැනීම වියන් බසට අවතීර්ණ වීමකි මේ.

විජිත ස්වාමීන් වහන්සේගේ පදරචනාවන් සඳැස හෝ නිසිස් ආකෘතිවලින් මිදී ඒ දෙකෙහි සංකලනයක් ලෙසින් ලියවී ඇති සේ ය.

"හැම දෙන ම මිතුරු වේ නම්
හැම පැතුම් සපල වේ නම්
ඉන් හැඟී සිටිනු කෙලෙස් ?
මට කියා දෙන්න සම්දේ "

ඉහත නිදසුනේ සැම පදයකම මාත්‍රා ගණන දොළහා බැගින් වෙයි. එහෙත් විරිතකට ගැයිය හැකියි. මුල් දෙපදයේ මුලට "හැම" සහ අගට "වේ නම්" වචන යෙදීම නිසාවෙන් නිරායාසයෙන්ම එළිසමය ඒ තැනවල රැකී සඳැස් ආකෘතියක් ගනියි. එහෙත් දෙපදය ඉන් මිදී නිසඳැස් ආකෘතියකට මාරු වෙයි. මුලට යෙදෙන "හැම", "ඉන්", "මට" යන වචන වෙනම ශබ්ද වීමෙන් ශබ්ද රසයක්ද ගායනයේ උපදවයි. විවිධ තැන්වල අවශ්‍ය මාත්‍රා ගණන රැකීමට එකම වචනය "බුදු රදාණන්", "බුදු රදුන් ", "බුදු හාමුදුරුවන්" ලෙසින් යොදා ගැනීමට උන් වහන්සේ වග බලා ගන්නා සේක. ඒ උන්වහන්සේ සතු කවිත්වය හා ගීයක ආකෘතිය පිළිබඳව ඇති අවබෝධයයි.

අප අතරින් දිවංගත වූ විශාරද ගුණදාස කපුගේ සංගීතවේදියාණන්ගේ මුල් කාලයේ දී අප ලත් ගුරු හරුකමක් වන්නේ ගීතය කෙටි විය යුතුය යන්නයි. කවි පන්තියක් ලෙස නොව, ප්‍රබලව අදහස් ප්‍රකාශවන ලෙස කෙටියෙන් ලිවීම පිළිබඳව එතුමා පොත පත පවා ලබා දී අපය දැණුවත් කළේය. " සසර වසන තුරු" ගීයට ඩෝල්ටන් අල්විස් නිබන්ධකයාණන් යොදාගන්නේ වචන විසි හතක් පමණකි.

මෙම ලියවිල්ල ලියනා අවස්ථාව වන විට අප හට අසන්නට ලැබුණු ගීත නතර අසූරින් තනු හා සංගීත නිර්මාණය පිළිබඳවත් ගායනය පිළිබඳවත් කෙටියෙන් සටහන් තබන්නේ ගීතයේ ඉතිරි අංග තැක පිළිබඳවද අවධානය යොමු කිරීමටයි.

මුල් කාලයේ නිර්මාණය වූ අපගේ බොහු ගී වලින් ජනිත වූයේ භක්ති රසයයි. අමරදේවියන් ගැයූ " පාරමිතා බල පූජිත පූජිත" ගීතය ඊට නිදසුනකි. පසු කාලීනව බොහු ගීය වඩාත් ශාන්ති හා කරුණා රසයෙන් අනූන විය. අමරදේවියන්ගේම "අඩවන් වූ දෙනෙතින්", "ඇසේ මතුවන" වැනි ගී ඊට නිදසුන් දෙයි.

මෙම ගීත එකතුවේ සියළු ගීතවල තනු හා සංගීත රටා නිර්මාණය කළ ඉන්ද්‍රාණි විජයලතා මහත්මිය බොහු ගී සඳහා අනුගමනය කර ඇත්තේ ද දෙවනුව කී රසයන් මුල කොටගත් ස්වර රටාය. ළමා ගී කීපය ඉන් මිදී මදක් වේගතවත් ලයකට නැතහොත් රිද්මයකට නිර්මාණය වී ඇත්තේය. "දෙවි ලෝ තලේ හෝ" ගීතය හා "රාජ යස ඉසුරින් " ගීතය මඳ ලයෙන් ගැයෙයි. "බුදුන් උපන් දින" ගීයට මදක් ශාස්ත්‍රීය මුහුණුවරක් දෙමින් හින්දුස්ථානී රාගධාරි සංගීතයට අනුව කෙටි ආලාපයක් එක්කර ඇත්තේය.

වළා කුලක් හා ළමයෙකු අතර කෙරෙනා සංවාදය ළමා ගායිකාව පමණක් යොදා ගායනය කරවීම පද රචනාවේ අර්ථයට හානි කර වී ඇති සේ හැඟෙයි. සංගීතය නිර්මාණය කිරීමේදී අපරදිග මෙවෙළම්වලට මූලිකත්වය දුන්න ද එය ගීතයෙන් උපදින භාවයන්ට එතරම් බලපෑ බවක් නොදැනෙයි. "බුදුන් උපන් දින" ගීතයේ වයලින හඬට තැම්මැට්ටම් හඬ රිද්මය දෙයි. "රාජ මන්දිර" ගීයේ තම්මැට්ටම් හඬට රිද්මය කැවීම සඳහා ඝන්ධාර හඬක් ද එක් වෙයි.

ගී සියල්ල ගැයූ ගයනි තාක්ෂනා වනිගනායක දැරිය සතුව ඇති මිහිරි ඔඩ අපහසුවකින් නොරව අසාගෙන සිටිය හැකිවන අතර, ඇය ගීත භාවාත්මකව ගයන්නීය. පුහුණු වූ ගායනීය හඬකින් නිවැරදිව ගයන්නීය අදය. කෙසේ වුව ද ආලාප කොටස ගයන්නේ ඇයම දැයි කිව නොහැකියි.

මෙවන් ගී එකතුවක් එළි දැක්වීමට උනන්දු වූ විනිතා, සරත් විජේරත්න ප්‍රමුඛ මිහිඳු ළමා සමාජයට අපගේ කෘතඥතාවය හිමි විය යුතුයි. පන් ලියවිල්ලට හිත නිව්වා.

LEARN JAPANESE

By a Qualified Experienced Teacher
(Northern Suburbs).

PREP to VCE
Help in essay writing, exam tips, conduct mock tests and preparation for VCE oral exam.

Individual classes for reasonable rates.
Contact: 0425396975